# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1502 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 02/12/2023 පැය 1205

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2023.12.01 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 08 | 10 | 762 | 3978 | ගෑස් සිලින්ඩර් 02<br>ගෑස් ලිප් 01<br>තඹ දඟර 09<br>යකඩ බැරල් 16<br>ප්ලාස්ටික් බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2023.12.01 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිකඩ පොලිස් වසමේ ඔබේසේකරපුර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 250 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන වැලිකඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන** ඔබේසේකරපුර **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැලිකඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.12.01 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නුරිය පොලිස් වසමේ නිල්වල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **වී 56 පතොරම් යෙදිය හැකි මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ එම පතොරම් 03 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන නුරිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන නිල්වල, නුරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** නුරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **බලපත්‍ර නොමැතිව කළුගල් කඩමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2023.12.01 වන දින උදෑසන කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මොරගහහේන පොලිස් වසමේ **ඔලබොඩුව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව එස්කැවේටර් යන්ත්‍ර යොදාගනිමින් කළුගල් කඩමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු එස්කැවේටර් යන්ත්‍ර දෙකක් ද සමඟ** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා වන මොරගහහේන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 හා31 ක් වන දබ්බැද්ද හා ඔලබොඩුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** මොරගහහේන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **මත්කරල් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2023.12.01 වන දින රාත්‍රී කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත චුන්නාකම් පොලිස් වසමේදී වැටලීම් දෙකක් සිදු කර **මත්කරල් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා මත්කරල් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා චුන්නාකම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන උතුරු ඌරුළු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 49 ක් වන ඒළාලේ ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ .** චුන්නාකම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**06.** **බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු මුදලට විකිණීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2023.12.01 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්වැටිතුරය පොලිස් වසමේ වැල්වැටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු මුදලට විකුණමින් සිටි පුද්ගලයෙකු මිලිලීටර් 180 අරක්කු බෝතල් 54 ක්, මිලි ලීටර් 500 බියර් ටින් 24 ක් හා අරක්කු විකිණීමෙන් උපයාගන්නා ලද බවට සැක කෙරෙන රුපියල් 7370/= ක් ද සමඟ** අත්අඩංගුවට ගෙන වැල්වැටිතුරය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ වැල්වැටිය, වැල්වැටිතුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වැල්වැටිතුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙළිය කඳවුර.**

2023.12.01 වන දින රාත්‍රී කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙළිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නෝර්වුඩ් පොලිස් වසමේ **කෙසෙල්ගමු ඔයේ මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා වන නෝර්වුඩ් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 29,32 හා 33 ක් වූ කොටගල හා බගවන්තලාව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** නෝර්වුඩ් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**08.** **නීති විරෝධී දුම්වැටි සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.12.01 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් විසින් අම්බලන්තොට පොලිස් වසමේ රෝහල පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 4000 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා අම්බලන්තොට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**